# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1864/38 - 2014 මැයි මස 28 වැනි බදාදා - 2014.05.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

**විනිමය පාලන පනත යටතේ දැන්වීම**

**(ලංකා ව්‍යවස්ථාදායක ප්‍රඥප්ති සංග්‍රහයේ 423 වැනි අධිකාරිය)**

**ශ්‍රී ලංකාවෙන් පිටත බැංකුවල ගිණුම් විවෘත කිරීම සහ පවත්වා ගැනීමට අවසරය**

විනිමය පාලන පනතේ 48 වැනි වගන්තිය සමඟ කියැවෙන 6AA වගන්තිය සහ 8 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ ශ්‍රී ලංකාව තුළ සිටින හෝ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තෙකුට සහ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සමාගම් හෝ ආයතනවලට ශ්‍රී ලංකාවෙන් පිටත බැංකුවක ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ ක්‍රියාත්මක කිරීමට හෝ එම ගිණුම් වසා දැමීමට පහත දැක්වෙන පරිදි මෙයින් පොදු අවසරය ප්‍රදානය කරනු ලැබේ.

2. මේ යටතේ ලබා දෙනු ලබන අවසරය පහත තැනැත්තන්ට අදාළ වේ :

(i) ව්‍යාපාර, අධ්‍යයන හෝ වෛද්‍ය ප්‍රතිකාර කටයුතු සඳහා තාවකාලිකව ශ්‍රී ලංකාවෙන් බැහැර වූ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තෙක් ව සිටින ;

(ii) ශ්‍රී ලංකාවෙන් පිටතට වෘත්තීමය සේවාවන් සපයන තැනැත්තෙක් හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සමාගමක් හෝ ආයතනයක් ;

(iii) ශ්‍රී ලංකාවෙන් පිටත ආයෝජනය කිරීම සඳහා මුදල් අමාත්‍යවරයා විසින් අවසර ලබා දුන් තැනැත්තෙක් හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සමාගමක් හෝ ආයතනයක් ;

(iv) වෙළෙඳ භාණ්ඩ අපනයනකරුවෙක් ;

(v) වෙනත් රටක වලංගු නිත්‍ය නේවාසික බලපත්‍රයක් ලබාගත් තැනැත්තෙක් ;

(vi) ද්විත්ව පුරවැසියෙක් ; සහ

(vii) අධ්‍යාපන කටයුතු සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව වෙනත් රටකට යාමට බලාපොරොත්තු වන ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තෙකුට, එකී රටේ වීසා අනුමත කරන අධිකාරිය විසින් ශිෂ්‍ය වීසා අනුමත කිරීමේදී කොන්දේසියක් ලෙස එම රටේ බැංකුවක ගිණුමක් ආරම්භ කර පවත්වා ගතයුතු යැයි ඉල්ලා ඇති අවස්ථාවකදී එම තැනැත්තන්.

3. විනිමය පාලන පනත ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් පිටත දී නිත්‍යානුකූලව ලැබූ හෝ අත්පත් කරගත් විදේශීය මුදල් හෝ අනුමත විදේශ විනිමය ගණුදෙනුවක් වෙනුවෙන් ගිණුම් හිමියා ශ්‍රී ලංකාව තුළ දී බලයලත් වෙළෙඳුන්ගෙන් හෝ අවසරලත් තැනැත්තන්ගෙන් ලබා ගන්නා ලද විදේශීය මුදල් මෙම ගිණුමට බැර කළ හැක.

4. විනිමය පාලන පනත ප්‍රකාරව, ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් වෙත අනුමැතිය ලබා දී ඇති ඕනෑම විදේශ විනිමය ගණුදනුවක් වෙනුවෙන් ගිණුම් හිමියාට මෙම ගිණුමේ අරමුදල් ප්‍රයෝජනයට ගත හැක.

5. පහත 6 වන ඡේදයේ සඳහන් කොන්දේසිවලට යටත්ව, මෙම නිවේදනයේ අවසරයට අනුකූලව එතෙර බැංකුවක ආරම්භ කොට පවත්වාගෙන ගිය ගිණුමක් වසා දැමුවේ නම් එම වසා දැමීමේ දින සිට මාසයක් ඇතුළත ගිණුමේ ශේෂය බැංකු ක්‍රමය හරහා ශ්‍රී ලංකාවට මව්හිමායනය කළ යුතුය.

6. මෙහි 2 වන ඡේදයේ (vii) වන අයිතමයෙහි කොන්දේසි ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් පිටත ගිණුමක් ආරම්භ කිරීමට සහ පවත්වා ගැනීමට අවසර ලත් තැනැත්තෙකුගේ ශිෂ්‍ය වීසා අයදුම්පතක් එකී රට විසින් ප්‍රතික්ෂේප වූ විටක හෝ ශිෂ්‍ය වීසා ලබා ගැනීමෙන් පසුව අධ්‍යාපන කටයුතු සඳහා විදේශ ගත නොවීමට තීරණය කළ විටක, එකී තැනැත්තා විසින් මෙම අවසරය යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත විවෘත කරන ලද ගිණුමෙහි බැරට පවතින සියළුම මුදල් එම තීරණය ගත් දින සිට මාසයක් ඇතුළත මව්හිමායනය කළ යුතුය.

7. මෙම නිවේදනයෙහි පෙළ යෙදුම අනුව වෙනත් අදහසක් ගම්‍ය නොවන්නේ නම් -

(අ) "බලයලත් ගනුදෙනුකරු" යන්නට විනිමය පාලන පනතේ දී ඇති අර්ථ නිරූපණයම අදාල වේ ;

(ආ) "අවසරලත් තැනැත්තා" යන්නෙන් තත්කාලය තුළ විනිමය පාලන පනතේ 5 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසර දෙනු ලැබූ ඕනෑම තැනැත්තෙකු අදහස් කෙරේ ;

(ඇ) "විදේශීය මුදල්" යන්නට විනිමය පාලන පනතේ දක්වා ඇති අර්ථයම අදාල වේ ;

(ඈ) "ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තෙකු" හෝ "ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකු" යන්නට විනිමය පාලන පනතේ 37(1) වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලදුව 1972 අප්‍රේල් මස 21 වැනි දිනැති අංක 15007 දරන රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද නියමයෙන් දක්වා ඇති අර්ථය ම දැක්වේ.

8. විනිමය පාලන පනතේ 48 වැනි වගන්තිය සමග කියැවෙන 6AA වගන්තිය සහ 8 වැනි වගන්තියේ (1) උප වගන්තියේ කොන්දේසි ප්‍රකාරව 2010 මාර්තු 11 දිනැති අංක 1644/26 සහ 2013 ජුනි 12 දිනැති අංක 1814/40 දරන *රජයේ ගැසට් පත්‍රයන්හි* පළ කරන ලද දැන්වීම් මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

පී. එච්. ඕ. චන්ද්‍රවංශ,<br>
විනිමය පාලක.

වර්ෂ 2014 ක් වූ මැයි මස 28 වැනි දින,<br>
කොළඹ දී ය.

06 - 342

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.